[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	විද්‍යාව	පත්‍රය II	පැය - 3 යි.

නම ....

සැළකිය යුතුයි.
- පැහැදිලි අත් අකුරෙන් පිළිතුරු ලියන්න.
- A කොටසේ ප්‍රශ්න හතරට දී ඇති ඉඩ ප්‍රමාණය තුළ පිළිතුරු සපයන්න.
- B කොටසේ ප්‍රශ්න පහෙන් තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සපයා අවසානයේ A කොටස හා B කොටසේ පිළිතුරු පත්‍රය එකට අමුණා බාරදෙන්න.

A කොටස

01. A) සත්ව දේහ පටක වර්ග 3ක් රූපයේ දැක්වේ.


A


B


C

i) ඉහත පටක වලට අදාලව පහත වගුව පුරවන්න.

පටකය	පටකයේ නම	පිහිටි ස්ථානය	කාර්යය
A	(a) ………………..	ජීවී දේහ පුරාම	(e) ....
B	(b)	මුත්‍රාශ බිත්තිය	පේශී සංකෝචනය හා ඉහිල්වීම
C	(c)	(d)	ඖෂධ ආස්තරණය කිරීම

(ල : 05)

ii) B පටකය හා මිනිස් රුධිර පටකය අතර දක්නට ලැබෙන වෙනස්කමක් ලියන්න.
.... (ල : 01)

iii) අන්තරස්ථාපිත මඩළ දක්නට ලැබෙන සුවිශේෂි පටක වර්ගයක් නම් කරන්න.
.... (ල : 01)

B) මිනිසාගේ පෝෂණ ක්‍රියාවට දායක වන ප්‍රධානම පද්ධතිය ආහාර ජීර්ණ පද්ධතියයි. මෙහි කොටස් දැක්වෙන සටහනක් පහත දැක්වේ.



i). A වෙත ශ්‍රාව නිකුත් කරන X ලෙස දක්වා ඇති ග්‍රන්ථිය කුමක්ද? (ල : 01)
....

ii). B ස්ථානයේ දී ආහාර ශ්වසන මාර්ගයට ඇතුල් වීම වැලැක්වීමට ඇති විශේෂ ව්‍යුහය කුමක්ද?
.... (ල : 01)

iii). C තුළින් ආහාර ගමන් කරන ක්‍රියාවලිය කෙසේ හඳුන්වයිද? (ල : 01)
....

iv). D යනු ආහාර තාවකාලිකව ගබඩා කරන ජීර්ණයද සිදු කරන අවයවයකි. එහිදී Y ලෙස නිකුත් වන ජීර්ණ යුෂය කුමක් ද? .... (ල : 01)

v). E ව්‍යුහයට එකතුවන Z මගින් මේද තෛලෝදකරණය සිදුවේ. මෙම ස්‍රාව නිපදවන ග්‍රන්ථිය කුමක්ද?
.... (ල : 01)

vi). F ව්‍යුහයේ පෝෂක අවශෝෂණය සඳහා ඇති අනුවර්තන 2ක් ලියන්න. (ල : 02)
....

vii). G ව්‍යුහයේ දී අවශෝෂණය කරන ද්‍රව්‍යයක් ලියන්න. (ල : 01)
....

02. A) මොළයේ කොටස් දැක්වෙන රූප සටහනක් පහත දැක්වේ.



i). කොටස් නම් කරන්න.

x ....
y ....
z .... (ල : 03)

ii). Y කොටසෙන් ඉටුකරන කාර්යයක් ලියන්න.
.... (ල : 01)

iii). පහත පද හඳුන්වන්න.

a). උත්තේජය - .... (ල : 01)
b). කාරකය - .... (ල : 01)

iv). ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකය කුමක්ද? (ල : 01)
....

v). රසායනික සමායෝජනය සිදු කරන හෝර්මෝන වල ලක්ෂණයක් ලියන්න.
.... (ල : 01)

B). ශාකයක ප්‍රභාසංශ්ලේෂණයට අවශ්‍ය සාධක පරික්ෂා කිරීමට සකස්කල ඇටවුමක් පහත දැක්වේ. එය පැය 48ක් අඳුරේ තබන ලද ශාකයකි.



i). මෙම ක්‍රියාකාරකමෙන් පරික්ෂා කිරීමට අපේක්ෂා කරන සාධක වෙන වෙනම ලියන්න.

1 ක්‍රියාකාරකමේ දී .... (ල : 01)
2 ක්‍රියාකාරකමේ දී .... (ල : 01)

ii). පත්‍රය පිෂ්ඨ පරික්ෂාවට ලක්කල විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද?

ක්‍රියාකාරකම 1 පත්‍රය .... (ල : 01)
ක්‍රියාකාරකම 2 පත්‍රය .... (ල : 01)

iii). මෙම ක්‍රියාකාරකමට ශාක පත්‍ර මධ්‍යසාරයේ තම්බන්නේ ඇයි.?
.... (ල : 01)

iv). ශාකයේ ප්ලෝයම පටකය ඔස්සේ ප්‍රභාසංශ්ලේෂණ ඵල පරිවහනය වන්නේ කුමන සංයෝගයක් ලෙසද? .... (ල : 01)

v). ප්‍රභාසංශ්ලේෂණයේ ගෝලීය වැදගත්කමක් ලියන්න.
.... (ල : 01)

03. A) අප එදිනෙදා ජීවිතයේ දී භාවිතයට ගන්නා මිශ්‍රණ වර්ග 2ක් පහත දැක්වේ.



ජලය + සීනි   ජලය + පාන් පිටි

i) A හා B මිශ්‍රණ හැඳින්විය හැකි නම් ලියන්න.
A ....   B .... (ල : 02)

ii) ද්‍රාවණයක් ලෙස හැඳින්විය හැක්කේ කුමන මිශ්‍රණයද? (ල : 01)
....

iii) ඔබ සඳහන් කළ ද්‍රාවණයේ ද්‍රාව්‍යය කුමක්ද? (ල : 01)
....

iv) ද්‍රාව්‍යතාව කෙරෙහි බලපාන සාධකයක් ලියන්න. (ල : 01)
....

B). ප්‍රබල අම්ලයක් හා ප්‍රබල භෂ්මයක් ප්‍රතික්‍රියා කළ විට ඵල 2ක් සෑදේ. ඉන් එක් ඵලයක් සෝඩියම් ක්ලෝරයිඩ් ය. (NaCl)

i) භාවිතා කළ භෂ්මයේ රසායනික සූත්‍ර ලියන්න. (ල : 01)
....

ii) ප්‍රතික්‍රියාවේ දී සෑදෙන අනෙක් ඵලය කුමක්ද? (ල : 01)
....

C). පහත දැක්වෙන්නේ ආවර්තිතා වගුවේ මූලද්‍රව්‍ය කීපයකි. ඒවා එම මූලද්‍රව්‍ය වල සත්‍ය සංකේත නොවේ. මෙම සංකේත භාවිතයෙන් පමණක් පිළිතුරු සපයන්න.

	P		Q			R	
S							T
	U						

i) ඉලෙක්ට්‍රෝන වින්‍යාසය 2,8,8,2 වන මූලද්‍රව්‍යයේ සංකේතය ලියන්න. (ල : 01)
....

ii) වඩාත් ධ්‍රැවීය අණුවක් සාදන මූල ද්‍රව්‍ය දෙක නම් කරන්න. (ල : 01)
....

iii) P හා R අතර සාදන සංයෝගයේ බන්ධන වර්ගය කුමක් ද? (ල : 01)
....

iv) ඒක පරමාණුක වායුවේ සංකේතය ලියන්න. (ල : 01)
....

v) Q මූලද්‍රව්‍ය ඔක්සිජන් සමග සංයෝජනය වී සාදන සංයෝගයේ ලුවිස් ව්‍යුහය ඇඳ දක්වන්න. (ල : 02)
....

vi) S^+ අයනයේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න. .... (ල : 01)

vii) පරමාණුක දැලිස් සාදන මූලද්‍රව්‍යය සඳහන් කරන්න. .... (ල : 01)

04. A) පහත දැක්වෙන්නේ තරංග වර්ගීකරණ දළ සටහනකි.



i) P හා Q නම් කරන්න. (ල : 02)

....

ii) P තරංග වල ලක්ෂණ 2ක් ලියන්න. (ල : 02)

....

iii) ඉහත තරංග වලින් සම්පීඩන හා විරලන ඇතිවන්නේ කුමන තරංග වර්ගයේ ද? (ල : 01)

....

iv) තරංග, යාන්ත්‍රික තරංග හා P ලෙස වර්ගකර ඇත්තේ කුමන ලක්ෂණයක් පදනම් කරගෙනද? (ල : 01)

....

B). ප්‍රකාශ උපකරණ කීපයක රූප සටහන් පහත දැක්වේ.



i) A,B,C,D උපකරණ වල නම් ලියන්න. (ල : 02)

....

ii) තල දර්පණයකින් සිදුවන පරාවර්තනය පහත දැක්වේ.



රූපයේ x ,y කෝණ හඳුන්වන නම් ලියන්න.

x - ....

y – ....

(ල : 02)

iii) ඉහත ප්‍රකාශ උපකරණ වලින්,

a). රියදුරාට පිටුපසින් පැමිණෙන වාහන දෙස බැලීමට උපකාර වන්නේ කුමක් ද? (ල : 01)

....

b). දන්ත වෛද්‍ය වරයාට දත් පරීක්ෂා කිරීමට උපකාරී වන්නේ කුමක්ද? (ල : 01)

....

iv). පහත කිරණ සටහන් සම්පූර්ණ කරන්න.



(ල : 03)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	විද්‍යාව	පත්‍රය II

නම ....

සැළකිය යුතුයි.
- පැහැදිලි අත් අකුරෙන් පිළිතුරු ලියන්න.
- B කොටසේ ප්‍රශ්න පහෙන් තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සපයා අවසානයේ A කොටස හා B කොටසේ පිළිතුරු පත්‍රය එකට අමුණා බාරදෙන්න.

B කොටස

05. A) මිනිස් ශ්වසන පද්ධතියේ රූප සටහනක් පහත දැක්වේ.



i) මෙම රූපයේ A සිට F දක්වා කොටස් නම් කරන්න. (ල : 03)
ii) A හි දක්නට ලැබෙන කාටිලේජ මුදු වල වැදගත්කම ලියන්න. (ල : 01)
iii) ශ්වසන ක්‍රියාවලියේ දී කාර්යක්ෂමතාව වැඩි කිරීමට D ව්‍යුහය ආශ්‍රිතව දක්නට ලැබෙන අනුවර්තන 2ක් ලියන්න. (ල : 02)
iv) ආශ්වාස වාතය නාසය හරහා ඇතුල් වීමේ දී සිදුවන වෙනස්කම් 02 ක් ලියන්න. (ල : 02)
v) ශ්වසනයේ දී උරස්කුහර පරිමාව වැඩිකිරීමට හා අඩු කිරීමට E වල පේශී වලට අමතරව දායක වන අනෙක් පේශී වර්ගය කුමක් ද? (ල : 01)

B) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ රූප සටහනක් පහත දැක්වේ.



i) A,B,C,D කොටස් නම් කරන්න. (ල : 01)
ii) ඩිම්බයක් සංසේචනය වන්නේ කුමන කොටසේදී ද? (ල : 02)
iii) රුධිරයේ අඩංගු ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන් හෝමෝන සාන්ද්‍රනය අඩුවීමත් සමඟ මෙම පද්ධතියේ සිදුවන ප්‍රධාන වෙනස්කමක් ලියන්න. (ල : 01)
iv) ආර්තව චක්‍රයේ සිදුවීම් මාලාව සිදුවන ප්‍රධාන ස්ථාන 02 ලියන්න. (ල : 02)
v) ගර්භාෂයේ දී මවගේ රුධිර වාහිනී සහ වැඩෙන කලලයේ රුධිර වාහිනී අතර ද්‍රව්‍ය හුවමාරු කරන ව්‍යුහය කුමක් ද? (ල : 01)
vi) ජනකයින්ගෙන් ජනිතයින්ට වර්ණදේහ ගමන් කිරීමේ දී පළමු විභාජනය හඳුන්වන නම කුමක් ද? (ල : 01)
vii) සුපුනිකා උත්තේජ හෝමෝනය ස්‍රාවය වන ස්ථානය කුමක් ද? (ල : 01)
viii) හෝමෝන වල ප්‍රධාන ලක්ෂණ 2ක් ලියන්න. (ල : 02)

06. A)



ඉහත දැක්වෙන්නේ ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය කෙරෙහි බලපාන සාධක සොයා බැලීම සඳහා වෙනස් තත්ව යටතේ තනුක අම්ලයක් (X) සමඟ Zn ප්‍රතික්‍රියා කිරීමට සැලැස්වූ අවස්ථා 4 කි.

i) ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය කෙරෙහි බලපාන කිනම් සාධක අධ්‍යයනය කිරීම සඳහා ඇටවුම් නිර්මාණය කර තිබේද? (ල : 02)

ii) a). තනුක අම්ලය (X) සමඟ Zn ප්‍රතික්‍රියාවෙන් සෑදෙන්නේ H_2 වායුව නම් X සඳහා සුදුසු තනුක අම්ලයක් යෝජනා කරන්න. (ල : 01)

b). එම ප්‍රතික්‍රියාවට අදාල තුලිත සමීකරණය ලියන්න. (ල : 01)

iii) A හා B ඇටවුම් දෙකෙන් ප්‍රතික්‍රියා සීඝ්‍රතාව වැඩි ඇටවුම හඳුනා ගැනීමට ඔබට දැකිය හැකි නිරීක්ෂණය සඳහන් කරන්න. (ල : 02)

iv) A හා C ඇටවුම් 2න් ප්‍රතික්‍රියා සීඝ්‍රතාව වැඩි ඇටවුම කුමක්ද? ඊට හේතුව කුමක්ද? (ල : 02)

v) H_2 වායුව හඳුනා ගන්නා ආකාරය ලියා දක්වන්න. (ල : 02)

B) එක්තරා උෂ්ණත්වයකදී ජලය $200cm^3$ තුල ග්ලූකෝස් 370g දියවී සංතෘප්ත ද්‍රාවණයක් බවට පත් විය. (ජලයේ සා.ඝ 1 gcm^{-3})

i) සංතෘප්ත ද්‍රාවණයක් යනු කුමක්ද? (ල : 01)

ii) එම ද්‍රාවණයට ද්‍රාවකය මිශ්‍ර නොකර තවත් ග්ලූකෝස් දියකරගත හැකි ක්‍රමයක් සඳහන් කරන්න. (ල : 01)

iii) a). ඉහත ද්‍රාවණයේ ද්‍රාව්‍යතාවය සොයන්න. (ල : 01)

b). ග්ලූකෝස් වල මවුලික ස්කන්ධය කීයද?. (ල : 02)

iv) NaOH $0.25moldm^{-3}$ සාන්ද්‍රණයක් ඇති ද්‍රාවණ $500cm^3$ තුල තිබෙන NaOH ස්කන්ධය සොයන්න. (ල : 02)

v) හුණුගල් යනු කැල්සියම් කාබනේට් නැමැති රසායනික සංයෝගයකි.

a). එම ද්‍රව්‍යයේ රසායනික සූත්‍රය කුමක්ද? (ල : 01)

b). එහි සූත්‍ර ස්කන්ධය සොයන්න. (ල : 02)

(Ca=40, C=12, O=16)

07. A) ඉස්කුරුප්පු නියන භාවිතා කර ඇණයක් තද කිරීමට හා බුරුල් කිරීමට බල යුග්මය යොදන අවස්ථාවක් පහත දැක්වේ.





i) ඉස්කුරුප්පු නියන ක්‍රියාකරවීම හැර බල යුග්ම යෙදෙන වෙනත් අවස්ථා 2ක් ලියන්න. (ල : 02)

ii) බල යුග්මයක් සතු ලක්ෂණ 2ක් ලියන්න. (ල : 02)
iii) බල යුග්මයක ඝූර්ණය සෙවීම සඳහා ප්‍රකාශනයක් තොරතුරු ඇසුරෙන් දක්වන්න. (ල : 02)
iv) ඉස්කුරුප්පු නියනේ මිට මහත් කලවිට ඇණය බුරුල්කිරීම තද කිරීම පහසු වේ. පහදන්න. (ල : 02)
v) ඒකාකාර සැහැල්ලු දණ්ඩක් එහි මධ්‍ය ලක්ෂ්‍යයෙන් එල්ලා සංතුලනය කර ඇත.
පහත රූපයේ w භාරය එල්ලා ඇති විට දණ්ඩ සමතුලිතව පවත්වා ගැනීමට C ලක්ෂ්‍යයේ එල්ලා තිබිය යුතු බර කොපමණද? (W= 20N)
vi) (ල : 02)



vii) ස්කන්ධය 2kg වූ පහත රූපයේ ඇති වස්තුව මත P දිශාවට $4ms^{-2}$ ත්වරණයක් ලබා දීමට යෙදිය යුතු F බලය සොයන්න.



B)



i) a). ගෘහ විද්‍යුත් පරිපථයේ A B C කොටස් නම් කරන්න. (ල : 03)
b). පාරිභෝගික ඒකකය සඳහා අදාල වන්නේ කුමන කොටස්ද? (ල : 03)
c). x හා y විදුලි රැහැන් මොනවාද? ඒවායේ වර්ණ වෙන වෙනම ලියන්න. (ල : 02)

08. A) වර්ධනය යනු ජීවීන් පෙන්වන ජීව ලක්ෂණයකි. වර්ධනය ආකාර 2කින් සිදුවේ. ඒවා නම් සෛල සංඛ්‍යාවෙන් වැඩිවීම හා සෛලය ප්‍රමාණයෙන් විශාල වීමයි. සෛල සංඛ්‍යාව වැඩි වීම සිදු වන්නේ සෛල විභාජනයෙනි.
i) සෛල විභාජන ක්‍රම 2 ලියන්න. (ල : 02)
ii) ඉහත විභාජන ක්‍රම 2හි ඇති එක් වෙනස්කමක් ලියන්න. (ල : 02)
iii) එක් එක් විභාජනයක් සිදුවන අවස්ථා සඳහා උදාහරණ එකක් බැගින් ලියන්න. (ල : 02)

B) ජීවීන් සතු ලක්ෂණ අතරින් ඇතැම් ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි. මේවා ආවේණික ලක්ෂණ ලෙස හඳුන්වයි.

i) මිනිසුන් තුල දැකිය හැකි සුලභ ආවේණික ලක්ෂණයක් ලියන්න. (ල : 01)
ii) නුමුහුම් උස TT ද නුමුහුම් මිටි tt ද ලෙස ගෙන නුමුහුම් උස ගෙවතු මෑ ශාකයක් නුමුහුම් මිටි ගෙවතු මෑ ශාකයක් සමග මුහුම් කල විට පළමු දරු පරම්පරාව ලැබෙන ආකාරය පනට් කොටුවක ඇඳ පෙන්වන්න. (ල : 02)

C) තාපය යනු ශක්ති විශේෂයකි. එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට තාපය සංක්‍රාමණය විය හැක.

i) තාපය සංක්‍රාමනය විය හැකි ක්‍රම 3ක් ලියන්න. (ල : 03)
ii) ලෝහ දණ්ඩක් තුලින් තාපය සංක්‍රාමණය වන ආකාරය කුමක් ද? (ල : 03)

iii) ආරම්භක උෂ්ණත්වය 25°C වූ ජලය 500g ක් පරිවාරක බඳුනක් තුල දමා එහි උෂ්ණත්වය 75°C තෙක් ගිල්ලුම් තාපකයක් මගින් රත් කරන ලදි. මෙහිදී ගිල්ලුම් තාපකය මගින් ජලය ලබා ගත් තාපය ගණනය කරන්න. (ජලයේ වි.තා.ධ $4200 Jkg^{-1}k^{-1}$) (ල : 03)

iv) ජලය රත් කිරීමට යොදාගත් තාපන ඒලකයට 230V විභව අන්තරයක් සපයා ඇති අතර එය තුලින් 4A ධාරාවක් ගමන් කරයි නම් එහි ක්ෂමතාව ගණනය කරන්න. (ල : 03)

v) ක්‍රීඩකයින්ගේ, පාසල් සිසුන්ගේ ඇඳුම් සඳහා සුදු වර්ණය සුදුසු යැයි නිර්දේශ කරන්නේ ඇයි? පහදන්න. (ල : 01)

09. A) ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පහත පියවර අනුගමනය කෙරේ.



i) මෙම නිෂ්පාදන ක්‍රියාවලයේ ඇති වෙන් කිරීමේ ක්‍රම මොනවද? (ල : 01)

ii) ලුණු ලේවායක් තැනීමේ දී සැලකිලිමත් විය යුතු සාධක 2ක් ලියන්න. (ල : 02)

iii) නොගැඹුරු තටාකයේ දී හා මධ්‍යස්ථ තටාකයේ දී තැන්පත් වන ලවණ වර්ග 2ක් පිළිවෙලින් ලියන්න. (ල : 02)

iv) ඇතැම් විට ලුණු වල තිත්ත රසයක් දැනීමට හේතුව කුමක්ද? (ල : 01)

B) ක්‍රීඩකයකු පන්දුවක් සිරස්ව ඉහලට විසිකර නැවත එය අල්ලා ගනියි. පන්දුවේ ස්කන්ධය 100g වන අතර ඉහළට විසිකරන පන්දව අතින් ගිලිහෙන මොහොතේ ප්‍රවේගය $20ms^{-1}$ වේ. (ගුරුත්වජ ත්වරණය $10ms^{-2}$)

i) පන්දුවේ බර කොපමණද? (ල : 02)

ii) පන්දුව ගමන් කල උපරිම උස කොපමණද? (ල : 02)

iii) පන්දුව අතමත පතිතවන මොහොතේ පන්දුවේ ගම්‍යතාවය සොයන්න. (ල : 02)

C) ළමයෙකු කරත්තයක් තිරස් පොළව මත තල්ලු කරගෙන යාමට උත්සහ කරයි. කරත්තයේ ස්කන්ධය 400kg කි. ළමයා ඒ මත 2000N ක බලයක් යෙදුවද එය චලිත වූයේ නැත. තවත් බලය වැඩි කල විට චලනය කල හැකි විය.

i) කරත්තය නිශ්චලව ඇති විට සිරස්ව ක්‍රියාකරන බලය නම් කරන්න. (ල : 02)

ii) කරත්තය මත 2000N යොදන අවස්ථාවේ රෝද මත ක්‍රියා කරන්නේ කුමන ඝර්ෂණ බලයද? (ල : 01)

iii) කරත්තය චලනය වන මොහොතේ එහි ත්වරණය $2ms^{-2}$ නම් කරත්තය මත ක්‍රියාත්මක වන අසංතුලිත බලය ගණනය කරන්න. (ල : 02)

iv) සීමාකාරී ඝර්ෂණ බලය කෙරෙහි බල නොපාන සාධකය කුමක්ද? (ල : 01)

v) ඝර්ෂණ බලය අඩු කර ගැනීමට හා වැඩි කර ගැනීමට යොදාගන්නා උපක්‍රමයක් බැගින් ලියන්න. (ල : 02)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය	පිළිතුරු

I පත්‍රය

01.	2	11.	3	11.	3	11.	2
02.	1	12.	2	12.	3	12.	1
03.	4	13.	3	13.	4	13.	2
04.	4	14.	3	14.	3	14.	4
05.	2	15.	4	15.	2	15.	3
06.	3	16.	-	16.	4	16.	3
07.	3	17.	3	17.	4	17.	3
08.	4	18.	2	18.	4	18.	2
09.	1	19.	1	19.	3	19.	1
10.	2	20.	2	20.	1	20.	3

(මුළු ලකුණු 1×40=40යි.)

II පත්‍රය

01. (i). (අ) ගණ - සමූහය (ආ) ගන -ඝන බව යන අර්ථ ප්‍රකාශ වන පරිදි වාක්‍ය තනා තිබීම.

(ii). (අ) දෘෂ්ටිගෝචර (ආ) ආස්වාදය

(iii). (අ) බත්+හුළු (ආ) දෙ+අමුණ

(iv). (අ) ව්‍යාකරණ (ආ) සම්ප්‍රදාය

(v). (අ) මව්තුමූ රසවත් ආහාර පිළියෙල කරති.

(ආ) සිසුන් හොඳින් පාඩම් කරති'යි ගුරුවරු සිතති.

(vi). (අ) සම්ප්‍රදාන විභක්තිය (ආ) ආධාර විභක්තිය

(vii). (අ) දුසිරිත් (ආ) කුලහීන

(viii). (අ) බලා (ආ) බලවයි.

(ix). (අ) කපුටු (ආ) සෝද

(x). (අ) ඇමතිතුමා විසින් නව ලේකම්වරියක් පත් කරනු ලබයි. / පත් කෙරෙයි. / ලැබේ.

(ආ) විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණ රචනා කළහ. (මුළු ලකුණු 2×10=20)

02. රචනය සඳහා

- සාරවත් භාවය - ලකුණු 07 (තේමාවට අදාළ බව, සරුබව හා සමබව,
- විස්තරයට අදාළ මාතෘකාව යෙදීම - ලකුණු 01 වචන 250 සමීපව පැවතීම.)

  - ලකුණු 08
- සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12

  (උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය)
- ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම. - ලකුණු 05

  (අත් අකුරු, වියරණ, විරාම ලක්ෂණ භාවිතය, අදාළ පරිදි ඡේද වෙන් කිරීම) (මුළු ලකුණු 25)

03. සාරාංශකරණය

- අන්තර්ගතය - ලකුණු 06
- වචන ගණන - ලකුණු 02
- ශිල්පීය දක්ෂතා - ලකුණු 02 (ලකුණු 10)

අන්තර්ගත කරුණු -

1. රටට විනිමය යොදා ගන්නා ලෙස අපනයන අංශයේ වර්ධනයක් හෝ ආනයන සීමා කර විදේශ වත්කම් පිරිමසා ගත යුතු ය.
2. පුරවැසියන් දේශීය දේ මත යැපීමට සූදානම් නොවීම.
3. ආනයනය අධෛර්යයට විශාල බදු පැනවීමෙන් ආණ්ඩුව අර්බුදයට පත්වේ.
4. විදේශ විනිමය වර්ධනයට සංචාරක ව්‍යාපාර දියුණු කිරීම හා ආයෝජන අවස්ථා සම්පාදනය කිරීම.
5. ඉන්දියාව හා චීනයට අපනයන කරන භාණ්ඩ සමස්තයෙන් සියයට දහයකටත් අඩු ය.

04. (i). වැඩ කළ හැකි සියලු දෙනාට රැකියා සැපයීමට.

(ii). මිනිසාගේ ආර්ථික ප්‍රශ්න දිගින් දිගටම නොවිසඳා පැවතීම නිසා.

(iii). * ආර්ථිකය මනුෂ්‍යය ජීවිතය කෙරෙහි ඇති කරවන විවිධ බලපෑම් සමථයකට පත් කර මිනිසා ආර්ථිකයේ වහලකු නොකිරීම.

* ආර්ථික බලවේග උපයෝගී කරගෙන ජීවිතය හැඩගස්වා ගැනීමට අවශ්‍ය පසුබිම් සකස් කිරීම.

(iv). ජනතාව

(v). මිනිසුන් කිහිප දෙනෙකුගෙන් ඉටුවන වැඩකට එක් යන්ත්‍රයක් යොදා ගැනීම නිසා මිනිස් (සේවක) අවශ්‍යතාව අඩු වීම නිසා. (ලකුණු 2×5=10)

05. අත් පත්‍රිකාව - මුළු ලකුණු 15 යි.

- ආකෘතිය - ලකුණු 04
- අන්තර්ගතය - ලකුණු 08
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

ආකෘතිය -

* මාතෘකාව - ලකුණු 01

* පළ කරන්නාගේ නම - ලකුණු 01

* පළ කරන දිනය - ලකුණු 01

* නිර්මාණාත්මකභාවය - ලකුණු 01

අන්තර්ගතය -

* ආයතනයේ නම සඳහන් වීම.

* වස විසෙන් තොර කාබනික පොහොර භාවිත වන බව

* මිලදී ගත හැකි ද්‍රව්‍ය සඳහන් වීම.

* සේවාව ලබාගත හැකි වේලාවන් සඳහන් වීම.

* දුර්ලබ එළවළු හා අවේනික පලතුරු ලබාගත හැකි බව.

* නොවැම්බර් 06 වන දින විවෘත වන බව

* එම මාසය සඳහා 15% වට්ටම ලැබෙන ආකාරය

* කාර්යක්ෂම සේවාව / වාහන නැවැත්වීමේ පහසුකම්

ශිල්පීය දක්ෂතා -

* නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම ආදිය

නැතහොත්

තීරු ලිපිය - මුළු ලකුණු 15 යි.

- ආකෘතිය - ලකුණු 04
- අන්තර්ගතය - ලකුණු 08
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

ආකෘතිය - මාතෘකාවට - ලකුණු 01
ලියන්නා සඳහන් කිරීම - ලකුණු 01
නිර්මාණශීලීත්වය - ලකුණු 02

අන්තර්ගතය - ලියා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න.

ශිල්පීය දක්ෂතා - නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු නිවැරදි පද බෙදීම.

III පත්‍රය

01. (i). (අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා

(ආ) එක් සියයක් රජ දරුවන් මරනු පිණිස ශෘංගිලා (විෂදමා) ඉදි කරන ලද මෙබඳු සුරා පානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධා කළේ යැයි කිපී නැවත රහසිගතව කේවට්ටයනට ද මෙලෙස පවසන ලද අවස්ථාව

(ii). (අ) වර - විශිෂ්ට සියොතුන් - පක්ෂීන්, කුරුල්ලන්

(ආ) පුරඹර වසමින් සිටි රහ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි

(iii). (අ) තේරවිලි කවි (ආ) දැනමුතුකමට කී කවි

(iv). හින්නිහාමි, පුංචි මැණිකා

(v). (අ) එස්. මහින්ද හිමි (ආ) ටිබෙටය

(vi). (අ) පී.බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර, මාකඳුරේ ගුණවර්ධන

(ආ) තාගෝර්ගේ නිර්මාණ

(vii). (අ) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ (මහාචාර්ය)

(ආ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා

(viii). (අ) විදාගම මෛත්‍රිය හිමි (ආ) හංස, සැළලිහිණි, ගිරා, කෝකිල, පරවි සංදේශ

(ix). (අ) අපටත් වැසිකිළියක් කෙටි කථාවේ කුණ ඉන්ස්පෙක්ටර්

(ආ) පුනරුප්පත්තිය හා තවත් කෙටිකථා හෝ (එතුමාගේ වෙනත් ඕනෑම කෙටි කථාවක්)

(x). (අ) උග්ගසේන නම් සිටුපුත්තුගේ වස්තුව

(ආ) උග්ගසේන සිටු පුත්‍රයා විසින් දෙමව්පියන්ට (මුළු ලකුණු 2×10=20)

02. (i). (අ) නිති - නිරන්තරයෙන්

(ආ) රුපුනොද - සතුරන්

(ii). (අ) සිංහබාහු, සිංහසීවලී

(ආ) සිංහබාහු නාට්‍යය.

(iii). (අ) අමාවතුර

(ආ) ගුරුළු ගෝමී, පොළොන්නරු යුගය

(iv). (අ) ලඹ - එල්ලෙන විලිකුන් - ඉඳුනු

(ආ) සුදුසු ලෙස ලකුණු ප්‍රදානය කරන්න.

(v). (අ) හොර අලිය වගේ

(ආ) තාත්තා (පටබැඳිගේ හේරත්) (ලකුණු 4×5=20)

- ප්‍රශ්න අංක 03 සිට 07 දක්වා ප්‍රශ්නවල පිළිතුරට සුදුසු ලෙස ලකුණු ප්‍රදානය කරන්න.

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න